**හිතවත් ගනුදෙනුකරුවැනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු නිපැයුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.
ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2 යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [+94(0)114711411] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබද විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **නේෂන්ස් මනි මාර්කට් ඉතුරුම් ගිණුම**<br><br>ඉතුරුම් ගිණුමක නම්‍යශීලී බව භුක්ති විඳිමින් ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමට මෙම ගිණුම නිතිපතා ඉතිරි කරන්නන්ට අවස්ථාව සලසා දෙයි. | • 7% ක වාර්ෂික පොලී අනුපාතය.<br>• ඉතුරුම් ශේෂය මත අයිරා පහසුකම.<br>• ගිණුම යටතේ සිදු කරනු ලබන ගනුදෙනු කෙටි පණිවුඩ මගින් දැනුවත් කිරීම.<br>• මෙම ගිණුම සඳහා ගිණුම් ප්‍රකාශ මාසිකව නිකුත් කරනු ලැබේ.<br>• අන්තර්ජාල බැංකු, ජංගම බැංකු සහ SMS බැංකු පහසුකම්.<br>• ඩෙබිට් කාඩ් පහසුකම. | • බැංකුවේ වෙබ් අඩවියෙහි පළකර ඇති බැංකුව විසින් අය කරනු ලබන ගාස්තු පිළිබද ලැයිස්තුව අනුව ලබා ගන්නා ඕනෑම අමතර සේවාවන් සඳහා සම්මත ගාස්තු අදාළ වේ. | නේෂන්ස් මනි මාකට් ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය:<br><br>• ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක්<br><br>• ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනය, පදිංචි ලිපිනයෙන් වෙනස් නම් ලිපින තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. | සුදුසුකම් ලැබීමේ නිර්ණායකයන්:<br><br>• වලංගු ජාතික හැඳුනුම්පතක් /විදෙස් ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• අවම මූලික තැ න්පතුව රු 1,000,000 ක් විය යුතුය.'<br>• රු 1,000,000 වඩා වැඩි ශේෂය සඳහා පමණක් පො ලී ලැබෙනු ඇත. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් මනි මාර්කට් ඉතුරුම් ගිණුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැ බේ.
- මෙම බැංකුව, රු 1,000,000/- ක් දක්වා තැන්පත් කරන එක් තැන්පත්කරුවකුට රැකවරණය සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ (SLDIS) සා මා ජිකයෙකු වේ.
- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, මෙහි ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.